# මුම්බායි ත්‍රස්තවාදී ප්‍රහාරය

අපි මුම්බායි ත්‍රස්තවාදී ප්‍රහාරය හෙළා දකිමු. ඒ ත්‍රස්තවාදීන් රැකීමට අපට කිසිම අවශ්‍යතාවක් නැත. ඉන්දියාව ත්‍රස්තවාදීන් සමග වහාම සටන් විරාම ගිවිසුමක් අත්සන් කළ යුතු යැයි අපි නො කියමු. ත්‍රස්තවාදීන්ට ලංකාවේ දී අවි ආයුධ පුහුණුවක් ලබාදිය යුතු යැයි ද අපි නො කියමු. අපි කොන්දේසි විරහිත ව ත්‍රස්තවාදය පරාජය කළ යුතු යැයි කියමු. එහෙත් ඒ අතර ත්‍රස්තවාදය පරාජය කර දේශපාලන විසඳුමක් දිය යුතු යැයි අපි නො කියමු. එසේ වුවද අපි එකක් දනිමු. ඉන්දීය ආණ්ඩුව මොන මනස්ගාත දෙඩෙව්ව ද මුම්බායි ත්‍රස්තවාදී ප්‍රහාරය රට ඇතුළෙන් ම පැන නැගි එකක් මිස පිටරටකින් සංවිධානය කළ එකක් නො වේ. පිටරටක් ත්‍රස්තවාදීන්ට සමහරවිට උදව්කරන්නට ඇත. එහෙත් ඒ බටහිර රටක් විය නො හැකි ය. පකිස්ථානය ද මේ මොහොතෙහි එවැනි මැදිහත් වීමක් කරාවි යැයි සිතිය නො හැකි ය. ප්‍රශ්නය මුළුමනින් ම මෙන් ඉන්දියාවේ නිෂ්පාදිතයකි.

ප්‍රශ්නය කුමක් දැයි කීමට ඉන්දියාව පැකිළෙයි. බටහිරයන් ද ඉන්දියාව ද මෙරට සිටින විවිධ සිංහල විරෝධීන් ද කියන්නේ ඉන්දියාව අනාගමික, ප්‍රාන්තවලට බලය බෙදා ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය විසඳා ඇති, සික් ජනවාර්ගියකුට වුව ද අගමැති විය හැකි, මුස්ලිම් ජනවාර්ගිකයකුට ජනාධිපති විය හැකි රම්‍ය. සුරම්‍ය සුබ දේශයක් බව ය. එහෙත් ඉන්දියාවේ හින්දි ප්‍රදේශවලින් පිටත ගමන්කරන්නකුට ඒ එසේ නොවන බව පැහැදිලි වෙයි. ඉන්දියාවෙන් ඉගෙන ගත හැකි ප්‍රධානම පාඩම නම් ජනවාර්ගික බහුතරයක් සිටින ප්‍රාන්ත තිබියදීත් ඒ ඒ ජනවරග අදාළ ප්‍රාන්තවල ප්‍රධාන වශයෙන් ජදිංචි වී සිටියදීත් ඒ ප්‍රාන්තවලට බලය බෙදා ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය විසඳිය නොහැකි බව ය. ලංකාවේ ඒ මූලික අවශ්‍යතා ද සම්පූර්ණ නො වෙයි. මෙරට දෙමළ ජනයා උතුරු හා නැගෙනහිර පළාත්වල බහුතරය නොවන අතර ඔවුන්ගෙන් බහුතරයක් අනෙක් පළාත්වල ජදිංචි වී ඇත.

මුම්බායි පිහිටා ඇති මහාරාෂ්ට්‍රයේ, තමිල්නාඩුවේ, පන්ජාබයේ හා තවත් ප්‍රදේශවල ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය විසඳා නොමැති බව පැහැදිලි ය. ඉන්දියාවේ ප්‍රශ්නය ඉන්දියාව ලෙස රටක් හා ඉන්දීය ජාතිය ලෙස ජාතියක් නිර්මාණය කරගන්නේ කෙසේ ද යන්න ය. ලංකාවේ ද ඇත්තේ එවැනි ප්‍රශ්නයකි. එහෙත් ඉන්දියාවේ ප්‍රශ්නය ලංකාවේ ප්‍රශ්නයට වඩා උග්‍ර වෙයි. ඒ තවමත් හරිහැටි මතුපිටට පැමිණ නැත. ඉදහිට මතුපිටට එන ප්‍රශ්නයෙන් මුම්බායි හි දී මෙන් ගිනි කඳු අතර මිනී කඳු ගොඩ ගැසෙයි.

ලංකාවේ පඬුඅබා රජු දවස පටන්ගෙන ගොඩනැගුණු ජාතියක් වෙයි. එදා සිට බැරි නම් ගැමුණු රජු දවස සිට පැවතෙන ඒකීය රාජ්‍යයක් වෙයි. අවශ්‍ය වන්නේ ලන්දේසීන් විසින් මෙරටට ගෙනෙන ලද දෙමළ ජනයාගෙන් ප්‍රධාන වශයෙන් පැවතෙන යාපන දෙමළ ජනයා ද, පසුව බිරිතානීන් විසින් ගෙනෙන ලද අයගෙන් පැවතෙන නැගෙනහිර පළාතේ හා කඳුකරයේ දෙමළ ජනයා ද, ප්‍රධාන වශයෙන් දකුණු ඉන්දියාවෙන් පැමිණි මුස්ලිම් ජනයා ද වෙනත් අය ද අර ජාතියට ඇතුළත් කරගන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට විසඳුමක් සපයා ගැනීම ය. මෙරට මුස්ලිම් ජනයා පැවත එන්නේ අරාබියෙන් පැමිණි පියවරුන්ගෙන් හා සිංහල මව්වරුන්ගෙන් නොවන බව පැහැදිලි ය. එලෙස පැවත එන්නන් දෙමළ කතාකරන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට දිය හැකි විශ්වාසනීය පිළිතුරක් නොමැත.

ඉන්දියාවේ ප්‍රශ්නය ලංකාවේ ප්‍රශ්නයට වඩා බෙහෙවින් උග්‍ර වෙයි. ඉන්දියාව බිරිතානීන් පැමිණීමට පෙර කිසි දිනෙක එක රාජ්‍යයක් ලෙස පැවතී නැත. එහි කිසි දිනෙක මුළු රට පුරා ප්‍රචලිත වූ ජාතියක් තිබී නැත. බිරිතානීන් ඉන්දියාව නිර්මාණය කෙළේ මුල පටන් අයන්නේ සිට ය. ප්‍රන්තවලට යම් බලයක් බෙදා දුන්න ද මධ්‍යයෙහි ජාතිය ගොඩ නැගීමේ කාර්යයෙහි ලා කිසිවක් කෙරී නැත. සික් අගමැතිවරයා හා මුස්ලිම් ජනාධිපතිවරයා යනු ඇස් බැන්දුම් මිස දුරදිග යන ඊනියා විසඳුම් නො වේ.

බිරිතානීන් පැමිණීමට පෙර වූයේ භාරතය ය. භාරතය වුව ද කිසි දා තනි රටක් ව පැවතී නැත. එහි භාරතීය හෝ වෙනත් නමකින් හෝ ජාතියක් ගොඩනැගී ද නැත. එහි ප්‍රතිඵලය වී ඇත්තේ බිරිතානීන්ට අළුතින් ම රටක් හා රාජ්‍යයක් ගොඩනැගීමට සිදු වීම ය. බිරිතානීන් තම පාලන සමයේ දී වත්මන් ඉන්දියාව මෙන් ම වත්මන් බංග්ලාදේශය හා පකිස්ථානය ද ඇතුලත් ව විශාල රාජ්‍යයක් පිහිටුවා ගෙන ඇත. ඒ රාජ්‍යය ඉතාමත් කෘත්‍රිම

© Prof. Nalin De Silva

ආකාරයකින් බ්‍රිතානි හමුදාව යොදාගනිමින් පවත්වාගෙන යනු ලැබිණි. එහෙත් බ්‍රිතාන්‍යයන් පිටත්ව ගියේ පකිස්ථානය හා බංගලාදේශය ඉන්දියාවෙන් වෙන් කරමිණි. එපමණක් නොවේ. නොබෝ කලකින් ම පකිස්ථානයෙහ් බංගලා දේශය වෙන් කෙරිණි. අද ඉන්දියාවේ කොටස් ද මධ්‍යයෙන් ගැළ වී යැමේ ප්‍රයත්නයක් ඇතැම් ප්‍රදේශවල පවතියි. එයට මුහුණ නොදී ප්‍රශ්නයට විසඳුම් නො මැත.

ඉන්දියාව, ඉන්දියාව  ලෙස පවත්වාගෙන යැමේ කාර්යයට උරදෙන්නෝ එරට මධ්‍යම පංතියට අයත් පිරිසකි. මොවුහු බ්‍රිතාන්‍යයන් විසින් නිර්මාණය කරනු ලැබුවෝ වෙති. මූලික වශයෙන් ගතහොත් ඔවුහු ලංකාවේ ඕල්කට් බෞද්ධයන් මෙන් වෙති. මේ මධ්‍යම පංතිය මතුපිටින් බටහිර යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට අයත් වෙයි. එහෙත් ඔවුහු මූලික වශයෙන් හින්දු ආගමිකයෝ වෙති. ඔවුහු එකිනෙකා සමග හින්දියෙන් (හා ඉංගිරිසියෙන්) කතා කරති. ඉන්දියාවේ ප්‍රධාන පෙළේ දේශපාලනඥයෝ ද, රාජ්‍ය තන්ත්‍රයේ නිලධාරීන්ගෙන් බොහෝ අය ද මේ මධ්‍යම පංතියට අයත් වෙති. ඔවුහු බටහිරයන් මෙන් හැසිරීමට උත්සාහ කරති. මුම්බායි ප්‍රහාරයෙන් පසුව ඇමතිවරයකු ඉල්ලා අස්වී ඇත්තේ බටහිර සම්ප්‍රදායක් පසුපස යමිනි. එහෙත් ඒ ප්‍රහාරය ගැන ඒ ඇමතිවරයාට කළහැකිව තිබුණේ කුමක් ද? මින් මතුව ද ප්‍රහාරයක් ප්‍රහාරයක් පාසා ඇමතිවරු අස්වීමට බලාපොරොත්තු වෙත් ද?

බටහිරයන් හා ඔවුන්ගේ අනුකාරක ප්‍රබුද්ධයන් කුමක් කීවද, ඉන්දියාව යනු හින්දු රටකි. තවද එහි මධ්‍යම පන්තිකයන්ට මහාරාෂ්ට්‍රයේ සිටිය ද, තමිල්නාඩුවේ සිටිය ද බොහෝවිට හින්දි කතාකළ හැකි ය. ඔවුහු ඉන්දීය ජාතියක සාමාජිකයෝ වෙති. එමෙන් ම ඉන්දියාව නම් රටේ පුරවැසියන් ලෙස ද සිතති, ක්‍රියා කරති. එහෙත් මධ්‍යම පන්තියේ ඇතැම්හු ද, මධ්‍යම පාන්තික නොවන්නෝ ද එසේ නො වෙති. ඔවුන්ට ඇත්තේ ප්‍රාදේශීය බැඳීම් ය. ඔවුහු තවමත් භාරතීය සම්බන්ධකම් ඇගයීම් මත රැඳෙති. ඉන්දියාවේ අතිමහත් බහුතරය සමන්විත වන්නේ ඔවුන්ගෙනි.

කලින් සඳහන්කළ ඉන්දීයයන් වී ඇති මධ්‍යම පන්තිය බ්‍රිතාන්‍යයන් විසින් ඇතිකළ බ්‍රිතාන්‍යයන්ගේ ඉන්දියානුවෝ වෙති. ඔවුහු සෙස්සන් ද ඉන්දීයයන් බවට පත්කිරීමට උත්සාහ කරන්නේ ක්‍රිකට් හා හින්දි චිත්‍රපටි හා හින්දී ගීත ඔස්සේ ය. ඉන්දියාවේ හින්දු සංස්කෘතිය වුව ද ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වෙයි. ඒ වෙනස්කම් ද විනිවිද ගොස් ඊනියා ඉන්දීය පොදු සංස්කෘතිය ඇතිකිරීමට පහසුම මාර්ගය ඇත්තේ ක්‍රිකට් හා හින්දි චිත්‍රපටි හා හින්දී ගීත ඔස්සේ බව ඉන්දීය ජාතිය තැනීමට උත්සාහ කරන්නන්ට අවබෝධ වී ඇති බව පැහැදිලි ය. ඉන්දියාවේ (භාරතයේ) ඉතිහාසය අනුව ඔවුන් එවැනි බොල් ඉන්දියාවක් කෙදිනක වුවද ගොඩනගනු ඇත. තම දඹදිව සංස්කෘතිය අමතක කර වයඹ දිගින් පැමිණි ආර්යයන් (ඔවුන් ජනවර්ගයක් ද නැත් ද යන්න මෙහි දී අදාළ නොවේ) අනුව ගොස් භාරතය බවට පත්වූ ජනකායකින් පැවතෙන්නන්ට භාරතීය සංස්කෘතිය ද හැරපියා ඉන්දීයයන් වීම අපහසු නො වේ.

එහෙත් එයට තරමක් කල්ගත වනු ඇත. එතෙක් ව්‍යාජ ප්‍රාන්ත බලය ප්‍රතික්ෂේප කරන තම ප්‍රාදේශීය භාරතීය බැඳීම්වලින් ඔබ්බට යැමට අකමැති පිරිස වත්මන් ඉන්දියාවට විරුද්ධව කැරළි ගසනු ඇත. මුම්බායි ත්‍රස්තවාදී ප්‍රහාරය එසේ පැන නැගුණු කැරැල්ලක කොටසක් පමණකි. එහි සම්භවය ඇත්තේ පිටරටක නො වේ. ඉන්දියානු ආණ්ඩුවට ප්‍රහාරයෙහි සම්භවය සොයාගැනීමට ඩෙකෑන් (මේ දක්ෂිණ යන්නෙහි ඉංගිරිසි විකෘතියකි) සානුවෙන් පිටතට යැමට අවශ්‍ය නො වේ. ඉන්දියාව නිදහස ලබාගැනීමෙන් පසුව ද අවුරුද්දක පමණ කාලයක් මහාරාෂ්ටයට අයත් ඔරංගාබාද් (අජන්ත එල්ලෝරා ලෙන් ඇත්තේ මේ වසමෙහි ය) ඇතුළු ප්‍රදේශ හයිද්‍රබාද්හි මහාරාජාගේ පාලනය යටතේ ස්වාධීන ව පැවතී ඇත. මහාරාජා ඉස්ලාම් භක්තිකයකු වූ බව අමතක නොකළ යුතු ය. මහාරාෂ්ට්‍රයේ මරාති භාෂාවට ප්‍රමුඛත්වය ලැබෙයි. බ්‍රිතානීන්ගේ ඉන්දීය මධ්‍යම පංතිය අවසානයේ දී ජයගනු ඇත. හින්දු ආගම හැරුණු විට ක්‍රිකට් හා හින්දි චිත්‍රපටි ඉන්දියාවේ පොදු සංස්කෘතියේ අංග වනු ඇත. එහෙත් එතෙක් හින්දි චිත්‍රපට් කර්මාන්තයෙහි ප්‍රධාන නගරය වූ මුම්බායි වුවද ත්‍රස්තවාදී ප්‍රහාරවලින් නිදහස් නොවනු ඇත. ඒ කෙසේ වෙතත් අප කිසිවිටෙකත් ඉන්දියාව අනුගමනය කළයුතු නොවේ. භාරතය අනුගමනය කරමින් වෛදික වීමට අපේ මුතුන්මිත්තන්ට අවශ්‍ය නො වීය. එමෙන් ම බ්‍රිතාන්‍යයන්ගේ ඉන්දියාව අනුගමනය කිරීමට ද අපට අවශ්‍ය නො වේ. අපට පඬුඅබා, දෙවනපෑතිස්, ගැමුණු නිරිඳුන් ගොඩනැගූ රටක් හා ජාතියක් වෙයි. අප කළයුත්තේ දෙමළ හා මුස්ලිම් ජනයා පොදු සංස්කෘතියක් තුළ ඒ රටට හා  ජාතියට බද්ධකර ගැනීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva